සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 කි. |

නම / பெயர் / Name ................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

## I කොටස

**සැලකිය යුතුයි**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පෘථිවිය සූර්යයා වටා පරිභ්‍රමණය වීමට ගතවන කාලය වන්නේ,
    (i) පැය 24 කි. (ii) පැය 12 කි.
    (iii) දින 365 කි. (iv) දින 366 කි.

02. යුරෝපා මහාද්වීපයට අයත් රටක් වන්නේ,
    (i) ශ්‍රී ලංකාව ය. (ii) ජපානය ය.
    (iii) බ්‍රසීලය ය. (iv) ප්‍රංශය ය.

03. දකුණු ආසියාතික රටවල 2012 සමාජ සංවර්ධන දත්ත අනුව ඉහළම ආයු අපේක්ෂාව පෙන්වන රට මින් කුමක්ද?
    (i) ඉන්දියාව (ii) ශ්‍රී ලංකාව
    (iii) මාලදිවයින (iv) නේපාලය

04. ශ්‍රී ලංකාවේ නායයෑම් අනතුරට බහුලවම ලක්වන දිස්ත්‍රික්කය මින් කුමක්ද?
    (i) නුවර එළිය (ii) පොළොන්නරුව
    (iii) යාපනය (iv) අම්පාර

05. නියඟ ඇතිවීමට බලපාන හේතුවක් නොවන්නේ මින් කුමක්ද?
    (i) පහත් බිම් ගොඩ කිරීම (ii) වියළි සුළං ප්‍රවාහ
    (iii) වනාන්තර ගිනි තැබීම (vi) ශාක ආවරණය ඉවත් කිරීම

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න වල නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරිමත ලියන්න.

06. ....................................... යනු ජලයෙන් වට වූ කුඩා ගොඩබිමකි. (දූපතක්, මහාද්වීපයක්, අර්ධද්වීපයක්)

07. ජාත්‍යන්තර දින රේඛාව ලකුණු කිරීමේදී ....................................... දේශාංශය පදනම් කරගෙන ඇත. ($0^0$, $90^0$, $180^0$)

08. අධික වර්ෂාපතනය නිසා ජල ගැලීම් හා නායයෑම් වලට ලක්වීමෙන් ....................................... භූ දර්ශනය නිරතුරු වෙනස් වේ. (වියළි කලාපීය, තෙත් කලාපීය, වෙරළ ආශ්‍රිත)

09. ශ්‍රී ලංකාව ………………………………………… දින ඉතා බිහිසුණු සුනාමි ආපදාවකට ලක්වීමෙන් විශාල ජීවිත හා දේපළ හානියක් සිදුවිය. (2004 දෙසැම්බර් 12, 2004 දෙසැම්බර් 24, 2004 දෙසැම්බර් 26)

10. ශ්‍රී ලංකාවේ භූ ලක්ෂණ සිතියමක ……………………………… කින් භූමියේ 50000cm ක් නිරූපණය කරයි. (1cm, 1/2cm, 2cm)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට අදාළ පිළිතුර නිවැරදි නම් (නි) අක්ෂරය වටා ද, වැරදි නම් (වැ) අක්ෂරය වටා ද රවුමක් අඳින්න.

11. ශ්‍රී ලංකාවට දකුණින් පැසිපික් සාගරය පිහිටා ඇත. (නි/වැ)

12. ජල පෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම ආපදා කළමනාකරණ චක්‍රයේ ආපදා අවස්ථාවේදී ගතයුතු ක්‍රියාමාර්ගයකි. (නි/වැ)

13. වියළි කලාපයේ ජනතාව නියං උවදුර නිසා පීඩාවට ලක් වේ. (නි/වැ)

14. වනහරණය වැඩි කිරීම මගින් දේශගුණික වෙනස් වීම් අවම කරගත හැකිය. (නි/වැ)

15. සිතියම් සූචකය මගින් සිතියමක මූලිකාංග හඳුනාගත හැකිය. (නි/වැ)

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේදී **A** කොටසේ දී ඇති ප්‍රකාශයට, වඩාත් හොඳින් ගැළපෙන පිළිතුර **B** කොටසින් තෝරා යා කරන්න.


| A | B |
|---|---|
| 16. අභ්‍යන්තර තැනිතලාවේ දක්නට ලැබෙන භූ ලක්ෂණයකි. | හෙන්නානිගල |
| 17. තල්ගස් බහුලව පවතින ප්‍රදේශයකි. | කොළඹ |
| 18. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාණිජ නගරයයි. | ශේෂ කඳු |
| 19. යාපන අර්ධද්වීපය හා යාබද දූපත් ආශ්‍රිත භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික භූ දර්ශනයකි. | යාපනය |
| 20. ආදී වාසීන් ජීවත්වන ප්‍රදේශයකි. | හුණුගල් පස |

(ලකුණු 20X2=40)

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- (අ) සහ (ආ) කොටස් දෙකටම පිළිතුරු සපයන්න.
- තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

01. (අ)




i. A අක්ෂරයෙන් දැක්වෙන මහද්වීපය නම් කරන්න.

ii. රතු මුහුද දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

iii. B අක්ෂරයෙන් දැක්වෙන අක්ෂාංශ රේඛාව නම් කරන්න.

iv. අත්ලන්තික් සාගරය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද? (ලකුණු 2x4=8)


(ආ)

i. පේදුරුතුඩුව දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද?

ii. නියගයෙන් ආපදා සිදුවන පොළොන්නරුව දක්වන අක්ෂරය කුමක් ද?

iii. කොළඹ නගරය දැක්වෙන අක්ෂරය කුමක්ද?

iv. තිරුකෝනේශ්වරම් කෝවිල පිහිටීම දැක්වෙන අක්ෂරය කුමක්ද?




(ලකුණු 2x4=8)

02. i. (අ) මහද්වීපයක් යනු කුමක් ද? (01)

(ආ) ලොව විශාලතම මහද්වීපය හා කුඩාම මහද්වීපය පිළිවෙලින් නම් කරන්න. (02)

ii. පෘථිවිය භ්‍රමණය හා පරිභ්‍රමණය යනු කුමක්දැයි වෙන වෙනම හඳුන්වන්න. (04)

iii. (අ) පෘථිවිය ගෝලාකාර වස්තුවක් බව ඔප්පු කිරීමට යොදා ගතහැකි සාක්ෂියක් සඳහන් කරන්න. (02)

(ආ) ශ්‍රී ලංකාවට අයත් දූපත් දෙකක් සඳහන් කරන්න. (02)

03. i. ශ්‍රී ලංකාවේ එක් එක් ප්‍රදේශවල දක්නට ලැබෙන ශාකවල විවිධත්වයක් ලැබේ. එයට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (02)

ii. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම සඳහන් කරන්න.

උතුරින් ..........................................

දකුණින් ..........................................

නැගෙනහිරින් ..........................................

බටහිරින් .......................................... (04)

iii. (අ) ශ්‍රී ලංකාවේ වියළි කාලගුණයක් දක්නට ලැබෙන මාස දෙකක් සඳහන් කරන්න. (02)

(ආ) ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම තුනක් සඳහන් කරන්න. (0

04. i. ශ්‍රී ලංකාව බහුවාර්ගික හා බහු ආගමික රටක් වශයෙන් හැඳින්වීමට හේතුව සඳහන් කරන්න. (02)

ii. ශ්‍රී ලංකාවේ ලෝක උරුම අතරින්, මානව නිර්මිත, සවාභාවික නිර්මිත ලෝක උරුම දෙකක් පිළිවෙලින් සඳහන් කරන්න. (04)

iii. (අ) පහත සඳහන් සංස්කෘතික උත්සව පවත්වන්නේ කුමන ආගමකට අයත් ජනතාවදැයි ඉදිරියෙන් සඳහන් කරන්න.

a මඩු මංගල්‍ය උත්සවය

b දීපවාලී උත්සවය (02)

(ආ) ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (03)


05. i. ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයේ දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ දෙකක් සඳහන් කරන්න. (02)

ii. වියළි කලාපයේ කැපී පෙනෙන මානව ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න. (04)

iii. (අ) වෙරළාශ්‍රිත ප්‍රදේශවල ඇති සම්පත් යොදා ගෙන සිදු කරනු ලබන කර්මාන්ත දෙකක් සඳහන් කරන්න. (02)

(ආ) ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත භූ දර්ශනයේ පහත සඳහන් භෞතික ලක්ෂණ වලට උදාහරණ එක බැගින් ලියන්න. බොක්ක / කලපුව / තුඩුව (0

06. i. ඉහත ආපදා කළමණාකරණ චක්‍රයේ A හා C යනුවෙන් දක්වා ඇති අවස්ථා දෙක නම් කරන්න. (02)




ii. C අවස්ථාවේ සිදු කරන ක්‍රියාමාර්ග 2 ක් සඳහන් කරන්න. (04)

iii. (අ) දේශගුණික වෙනස්වීම් වල ප්‍රතිඵල දෙකක් සඳහන් කරන්න. (02)

(ආ) අධික වැසි මගින් ඇතිවන ආපදා තුනක් සඳහන් කරන්න. (03)

07. i. ගංවතුර ආපදාවෙන් ප්‍රබල ලෙස හානි සිදුවන ශ්‍රී ලංකාවේ පිහිටි දිස්ත්‍රික්ක දෙකක් සඳහන් කරන්න. (02)

ii. පහත සඳහන් හේතු නිසා ඇති වන උපද්‍රව තත්වය, දී ඇති වරහන් තුළින් තෝරා ලියන්න.

(අ) න්‍යෂ්ටික පිපිරීම්

(ආ) මුහුදේ සිදුවන භූමිකම්පා

(ඇ) උස්බිම් වල ජලය රඳවා තිබීම

(ඈ) ගංගා නිම්න වල වැලි ගොඩ දැමීම

(භූමිකම්පාවී, පුළි සුළං, ගංවතුර, නියගය, නායයෑම්, සුනාමී) (04)

iii. දේශගුණික වෙනස්වීම් අවම කරගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න. (05)